## ශීර්ෂය 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

----------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූලි 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාර දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ අත්තිකාරම් ගිණුමෙහි ශේෂය රු.6,648,748,415 ක් වූ අතර භාණ්ඩාගාර වාර්තා අනුව එම ශේෂය රු.6,648,923,249 ක් වූයෙන් වෙනස රු.174,834 ක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කල යුතු වේ. |

**(ආ) වාණිජ අත්තිකාරම් ගිණුම**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.192,233,776 ක් විය යුතු වුව ද එම වටිනාකම රු.115,492,778 ක් ලෙස ශේෂ පත්‍රයේ දක්වා තිබූ අතර එදිනට ඉඩම් හා ගොඩනැගිලි සඳහා සමුච්චිත ක්ෂය වටිනාකම රු.87,861,925 ක් විය යුතු වුව ද ශේෂ පත්‍රයේ රු.164,602,922 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.76,740,997 ක් අඩුවෙන් ශේෂ පත්‍රයේ දක්වා තිබූ අතර සමුච්චිත ක්ෂය වටිනාකම රු.76,740,997 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු ය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය රු.11,120,929 ක් වුව ද වර්ෂයේ ක්ෂය වටිනාකම ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට රු.87,861,925 ක් හර කිරීම හේතුවෙන් ලාභය රු.76,740,997 ක් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු ය. |

(ඇ) **මූල්‍ය නොවන වත්කම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ අරමුදල් භාවිතා කරමින් 2021 වර්ෂයේ මිලදීගත් රු.30,439,165 ක් වටිනා වත්කම්, ගිණුම් ගත කර නොතිබුණි. | වත්කම් CIGAS වැඩසටහනට ඇතුළත් කරමින් පවතී. | ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතු ය. |
| (ii) ඉසුරුපාය සහ මහරගම පොත් වෙළෙඳසැල්වල ඇති පෙළ පොත්, අතිරේක පොත් හා ගුරු අත්පොත් වලට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය ඉදිරිපත්කර නොතිබූ අතර එම තොග මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. | ඉසුරුපාය හා මහරගම පොත් වෙළෙඳසැල් භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර සමීක්ෂණ වාර්තා භාර දී නැත. | භාණ්ඩ සමීක්ෂණ පවත්වා ඒ අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂයේ පොත් අලෙවි ආදායම රු.16,987,250 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගතකිරීම නිසා අයහාරය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වන බව | නිවැරදිව ගිණුම්ගත කල යුතු වීම. |
| (ආ) පාසල් සඳහා නොමිලේ ලබාදෙනු ලබන පෙළපොත් මුද්‍රණය හා බෙදාහැරීමේ විදයම් සඳහා අනුමත අත්තිකාරම් ගිණුම යටතේ අරමුදල් සපයා දෙනු ලබන අතර පෙළපොත් පාසල් සිසුන් වෙත නොමිලේ බෙදාහැරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මිලට ගන්නා ලද බවට සළකමින් එම පොත් වල වටිනාකම වර්ෂයේ වෙළඳ පිරිවැටුම ලෙස දක්වා තිබුණි. මේ අනුව 2021 | සත්‍ය ආදායම් ලැබීමක් සිදු නොවේ | ශේෂ පත්‍රයේ නිවැරදි තත්ත්වයන් පෙන්නුම් කිරීමට කටයුතු කළ යුතු ය. |

දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආදායමට පැවරීමට ඇති ලාභ ශේෂය රු.1,970,635,235 ක් ලෙස දක්වා තිබුණ ද එම වටිනාකම නාමික ලාභායක් පමණි.

**2.2** **බැංකු ගිණුම් මෙහෙයවීම**

-------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අවස්ථා 283 කට අදාළ ව රු.15,132,501 ක හඳුනානොගත් ලැබීම් තිබුණි. | ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතු වේ. |

**2.3** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය හා 03 (ආ) ඡේදය | චක්‍රලේඛ විධිවිධාන අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම විස්තරාත්මක හා පැහැදිලි ලෙස සකස් කර නොතිබුණි. | අදහස් දක්වා නැත | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු බව. |
| (ආ) | ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදය හා 2009 පෙබරවාරි 20 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1589/30 අංක දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදය | මෙම නීති රීති වලට පටහැනිව නිලධාරීන් 38 දෙනෙකු අවුරුදු 05 ත් 26 ත් අතර කාල පරාසයක් දෙපාර්තමේන්තුවේ සේවය කරමින් පැවතුණි. | අදහස් දක්වා නැත | චක්‍රලේඛ පරිදි ස්ථාන මාරුවීම සිදු කළ යුතු බව. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------------

**3.1** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 10.2 ඡේදය ප්‍රකාරව සමාලොචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික කාර්ය සාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | සකස්කරමින් පවතී | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම. |

**3.2** **විදේශ ආධාර ව්‍යාපෘති**

-------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ දී සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියට ලැබුණු ප්‍රතිපාදන රු.5,758,993 ක් වැය කරමින් "යාළු යාළු යාළුවෝ" නමින් ළමා කෘතියක පිටපත් 228,950 ක් මුද්‍රණය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම පොත් 28,600 ක් ගබඩාවේ ඉතිරිවී තිබුණි. | පවතින ඉන්ධන අර්බුදය නිසා මෙම තොගය මෙතෙක් බෙදාහැරීමට අපහසු වී ඇත | විධිමත් ක්‍රමයකට පොත් බෙදාහැරීමට කටයුතු කිරීම හා ව්‍යාපෘති ප්‍රතිපාදන මනා කළමනාකරණයක් සහිතව භාවිතා කළ යුතු බව. |

**3.3** **ප්‍රසම්පාදනයන්**

-------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෙළපොත් බෙදාහැරීම සඳහා භාවිතාකරන වාහන, ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුව ලබාගෙන තිබුණද ලංසුවට ඉදිරිපත් නොකළ වාහන පොත් ප්‍රවාහනයට යොදාගන්නා බවත් ප්‍රවාහන ආයතන විසින් අදාල ගිවිසුම බලාත්මකව තිබියදී ගිවිසුම්ගත වූ සමහර වාහන අලෙවිකර ඇති බවත් නිරීක්ෂණය විය. | පිළිතුරු ලැබී නොමැත | ලංසු හා ගිවිසුම් කොන්දේසි අනුව ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවිය යුතු ය. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනානොගැනීම නිසා 2018 හා 2021 වර්ෂ වලදී පිළිවෙලින් රු. 83,680,906 ක් හා රු.8,484,244 ක් වටිනා පොත් අපහරණය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.9,646,512 ක් වටිනා පොත් අපහරණය කළ යුතුව තිබුණි. | එකඟ වන බව | වර්ෂයට අදාල පෙළපොත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඒ අනුව කටයුතු කිරීම. |
| (ආ) | 2022 මැයි 31 දිනට පෞද්ගලික මුද්‍රණ ආයතන මගින් ලැබිය යුතු රු.29,246,583 ක් වටිනා පොත් පිටපත් 365,715 ක් සහ රජයේ මුද්‍රණ ආයතන වෙතින් ලැබිය යුතු රු.11,087,962 ක් වටිනා පොත් පිටපත් 125,415 ක් ලබාගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් නියමිත අවස්ථාවේ දී පොත් බෙදාහැරීමේ ප්‍රමාදයන් සිදුවී තිබුණි. | පිළිතුරු ලැබී නොමැත | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව නිසි වේලාවට පොත් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වාර්ෂික පොත් අවශ්‍යතාවය හා ඉතිරි තොග සැලකිල්ලට ගෙන පොත් මුද්‍රණය නොකිරීම හේතුවෙන් පිටිපන ගබඩා පරිශ්‍රයක රු.3,458,061 වටිනා වර්ග 53 කට අයත් ගුරුමාර්ගෝපදේශ 153,056 ක් හා වටිනාකම හඳුනානොගත් ගුරු අත්පොත් 3,485 ක් තිබුණි. | පිළිතුරු ලැබී නොමැත | වාර්ෂික පොත් අවශ්‍යතාවය හා ඉතිරි තොගය සැලකිල්ලට ගෙන පොත් මුද්‍රණය කිරීමට කටයුතු කිරීම. |
| (ඈ) | 2009 වර්ෂයේ සිට මුද්‍රණ ගාස්තු වෙනුවෙන් පෞද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.7,431,012 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| **----------------------** | **---------------------** | **------------** |
| අනුමත කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු 48 ක් පවතින අතර පෙළ පොත් සකස් කිරීමට අවශ්‍ය වන චිත්‍ර ශිල්පි තනතුරු 01 ක් හා පරිගණක පිටු සැකසුම්කරණ තනතුරු 04 ක් ද මෙම පුරප්පාඩු වලට ඇතුළත් වී තිබුණි. | එකඟ වී ඇත. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කිරීම. |